අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023

පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................
(මුලකුරු සමග නිවැරදි ව ලියන්න)

02. විදුහලේ නම සහ ලිපිනය : ..........................................................................

03. පාසල් වර්ගය : 200ට අඩු/201 - 500 තෙක් / 500ට වැඩි

04. කලාපය : ..........................................................................

05. පළාත : ..........................................................................

## පද්‍ය නිර්මාණය හා අවබෝධය

7 ශ්‍රේණිය

කාලය පැය 02යි

* පළමුවන කොටසට අයත් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* දෙවන කොටසේ (අ), (ආ) ප්‍රශ්න දෙකෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න.
* ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

### I කොටස

01. (අ) ''මලක සුවඳ දසත හමයි'' යන වැකිය පද මාරු කොට මෙසේ ලිවීමට හැකි ය.

1. දසත සුවඳ හමයි මලක
2. හමයි සුවඳ මලක දසත
3. දසත හමයි මලක සුවඳ
4. හමයි දසත මලක සුවඳ

මෙය ආදර්ශයට ගෙන, අර්ථයට බාධාවක් නොවන ලෙස ඉන් එක් ආකාරයකට පහත දැක්වෙන වැකි, පද මාරු කරමින් ලියන්න.

(i) සඳ පායා සිසිල ගලා
(ii) දෙමවුපියෝ අප සුරකිති
(iii) ගොවියෝ කෙත්වතු පුරවති
(iv) අහස උසට අපි නැග යමු
(v) අඳුර බිඳී පහන් සිලක්
(vi) පහන නිවී අඳුර ගලයි
(vii) පොත් කියවති නැණැති දනෝ
(viii) සඳ සුදිලෙයි ආකාසේ
(ix) මුනිවර බණ සිත පහදයි
(x) ළමෝ තුටින් ගීත ගයති

(ලකුණු 1/2 x 10 = 05)

(ආ) පහත ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශබ්ද රසය තියුණු කිරීමෙහිලා කවීන් විසින් බෙහෙවින් භාවිත කරන්නා වූ අලංකාර කිහිපයකි. අකුරක් හෝ ශබ්දයක් හෝ පදයක් හෝ පුන පුනා කීම අනුප්‍රාසය නම් වේ.

කවියක එක් එක් පදයෙහි,මුල,මැද අග යන තැන්හි හෝ ඉන් එක තැනක හෝ සමාන අකුරු යෙදීම එළිසමය නම් වේ. පෙළට සිට වූ වැටක් මෙන් පෙනෙන හෙයින් මෙය එළිවැට නමින් ද හැඳින්වේ.

ඇස ඇස රස අඳුන්
දක දක රුසිරු මුනිඳුන්
මෙත සිත තුළ නුඳුන්
අහෝ බල බලව දොස් පුහුදුන්

(i) "එළිවැට" යන්නට තවත් යෙදුමක් ලියන්න (ලකුණු 01)

(ii) ඉහත දක්වා ඇති කවියෙන් අනුප්‍රාස කියැවෙන පද්‍ය පාද දෙකක් උපුටා දක්වන්න. (ලකුණු 02)

(iii) ඉහත දක්වා ඇති කවියෙන් එළිවැට දක්වෙන පද්‍ය පාද උපුටා දක්වන්න. (ලකුණු 02)

02. දී ඇති නිදසුන් සැලකිල්ලට ගෙන එළිසම වදන් යොදා පහත වගුවේ හිස්තැන් පුරවන්න.

නිදසුන:

| දුවන | ගුවන | නිවන | දවන | හවන |
|---|---|---|---|---|
| රසය | | | | |
| පවස | | | | |
| බලන | | | | |
| සසර | | | | |
| තමර | | | | |
| දල්ල | | | | |
| බලන | | | | |
| සතර | | | | |
| සුරස | | | | |
| නගන | | | | |

(ලකුණු 10)

03. පහත සඳහන් පැදි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වෙරළු ගෙඩිය හරි අටකට කපා ගෙන
කොටසක් නොකා දෙගුරුන්ටත් තබා ගෙන
උන් අපි එද සත් කුළු පව් විලාසෙන
පැල ඉනි වැටට ඇයි අද ඇන කොටා ගෙන

පොඩි උන් දෙහේ මල් මතකය ඉරා ගෙන
හොඳ හිත ගිහින් උඩු හුළඟට ගසා ගෙන
මහගෙයි බිමට තනි උරුමය කියා ගෙන
සතුරන් වෙලා උනුනට දෙස් තියා ගෙන

(i). මෙම පවුලේ දරුවන් කී දෙනෙක් සිටියෝ ද?

(ii). මෙහි දක්වෙන උපමාවක් ලියා දක්වන්න.

(iii). "කුඩා කාලයේ "යන අරුත දෙන යෙදුම උපුටා ලියන්න.

(iv). දරුවන් වැඩිමහල් වූ විට අසමගි වී ඇත්තේ කුමක් සඳහා ද?

(v). කුඩා කාලයේ දරුවන්ගේ හොඳ හිතට දූන් සිදු වී ඇත්තේ කුමක් ද?

(ලකුණු 10)



CamScanner

4. (අ) විරිත් නොකැඩෙන සේ පහත දැක්වෙන සිවුපද පද්‍යවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) දුටු විට පුර හඳ අගේ (මාත්‍රා 11)

.............................................. (මාත්‍රා 11)

හිතට මගේ කවි නැගේ (මාත්‍රා 11)

.............................................. (මාත්‍රා 11)

(ii) .............................................. (මාත්‍රා 12)

ඇළ දොළ දිය එකතුවෙලා (මාත්‍රා 12)

ගඟක් ගලයි සයුර බලා (මාත්‍රා 12)

.............................................. (මාත්‍රා 12)

(ලකුණු 04)

(ආ) පහත දැක්වෙන කවි පැනවලට අදාළ විරිතින් පිළිතුරු ලියන්න.

(i) කුරුලු පැටව්
හඬ තලමින්
හොට දිගු කර
ඇයි බලමින්

(iii) සොම්නස පිරි මිහිරි ලොවක්
සාමය පිරි සමගි රටක්
සිනහව පිරි මියුරු වතක්
අගෙයි නේද සුවැති දයක්

(ii) වැව් බැඳි මේ රජ රටයි
කෙත්වතු දිලි ගම රටයි
දකින ඔබේ සිතිවිලි ගොනු
ලිව්වොත් මෙහි හරි අගෙයි

(ලකුණු 02x3 =06)

05. පහත දැක්වෙන පින්තූරය හොඳින් නිරීක්ෂණය කර ඔබේ සිතේ මතුවන අදහස් පද්‍ය අටකට නොඅඩු පැදි පෙළකින් නිර්මාණය කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.



(ලකුණු 10)

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!
CamScanner

01. (අ) කොටසින් එක් කොටසක් හෝ (ආ) කොටසේ කොටස් දෙකෙන් එක් කොටසක් හෝ තෝරා ගෙන පද
අවසාන කොටසට නොඅඩු නිර්මාණයක් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) (i)

| | |
|---|---|
| නිවාඩු කාලේ | බලා |
| නිදහස ලැබ සැරි | සරා |
| පොතින් පතින් | ඉගිලිලා |
| පියඹා යමු රට | වටා |

(ii)

| | |
|---|---|
| ගුණ නැණ | වඩවන |
| සිසු හද | දිනවන |
| ගුරුතුම ඔබ | ගුණ |
| සැමරේ හැම | දින |

(iii)

| | |
|---|---|
| ගමන බිමන | පහසුවෙන් |
| අධිවේගේ යයි | සැණෙකින් |
| අනතුරු බොහෝ වේය | දූන් |
| වැළකිය හැකි කෙළෙස | ඉන් |

(iv)

| | |
|---|---|
| මහ මුහුදක් වැනි | අම්මා |
| සඳ මෙන් බබලන | අම්මා |
| රන් සමනල ගිරි | මුදුනේ |
| සිරිපා පද්මය | අම්මා |

(v)

| | |
|---|---|
| සැඩ සුළඟයි අකුණු | ගසයි |
| වැහි ඇද | හැලෙනා |
| අඳුර ගලයි මම | තනියම |
| මට බය | හිතුණා |

(ලකුණු 50)

(ආ) (i) ඔබ අහසේ සරන කුරුල්ලෙකු යැයි සිතා ඔබට හැඟෙන දේ කවියට නගන්න.

*නැතහොත්*

(ii) පාසල් පරිසර සංවිධානයේ සභාපති ඔබ යැයි සිතා පාසල් රුක් රෝපණ උත්සවයේ දී ඔබ එහි පිරිස අමතා සිදු කරන කවි කතාව ලියන්න.

PAST PAPERS WIKI

(ලකුණු 50)

(4) WWW.PastPapers.WiKi (4)

CamScanner